දුරකථන/ Telephone Nos.
தொலைபேசி இல.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50
Fax } 2784846
ඊමේල් – ஈ-மெயில் /E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල

"இசுருபாய"
பத்தரமுல்ல

"Isurupaya",
Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. }

මගේ අංකය / எமது இல. / My No. } ED /09/17/04/16

දිනය / திகதி / Date } 2017.11.06

**චක්‍රලේඛ අංකය: 41/ 2017**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ. ව රුන්
සියලුම විදුහල්පතිවරුන්

## සමස්ත ලංකා පාසල් හස්ත කර්මාන්ත තරගය හා ප්‍රදර්ශනය

ශ්‍රී ලංකාවේ අස්පර්ශනිය සංස්කෘතික උරුමයෙහි ඉතා වැදගත් ස්ථානයක් උසුලන හස්ත කර්මාන්ත හා පාරම්පරික ශිල්ප කලා නිර්මාණ ලොව පුරා පිළිගැනීමට ලක්වී ඇත. මෙම ක්ෂේත්‍ර හා සබැඳි දැනුම, ආකල්ප හා කුසලතා අනාගතය සඳහා දායාද කරමින් දේශීයත්වය අගයන ශිෂ්ට සම්පන්න සංස්කෘතික පරිසරයක් තුළ නව අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා සිසු දරු පරපුර සූදානම් කරවීමටත්, ඔවුන්ගේ නිර්මාණාත්මක කෞෂල්‍යය ප්‍රවර්ධනය කිරීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වන ජාතික ශිල්ප සභාව ඒකාබද්ධව සමස්ත ලංකා පාසල් හස්ත කර්මාන්ත තරගය හා ප්‍රදර්ශනය වාර්ෂිකව පවත්වනු ලැබේ.

**01. අරමුණු :**

1. පාසල් දූ දරුවන්ගේ සැඟවුණු දක්ෂතා කලඑළි දැක්වීම, දිරිගැන්වීම සහ ඇගයීම
2. ලාංකීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ අස්පර්ශනීය උරුමයන් හඳුනාගෙන ප්‍රචලිත කිරීම
3. සාම්ප්‍රදායික හා සංස්කෘතික වටිනාකමක් ඇති අත්කම් ශිල්ප සංරක්ෂණය කරමින් දේශීය හස්ත කර්මාන්ත නගා සිටුවීම
4. හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා රජයේ මැදිහත්වීම ශක්තිමත් කර පාසල් දූ දරුවන් හා ජනතාව අතර හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රචලිත කිරීම
5. ආත්ම අභිමානය වර්ධනය වන පරිදි, ශ්‍රම වෙළඳපොළට අවශ්‍ය ශිල්පීය කුසලතා සිසුන් තුළ වර්ධනය කිරීම හා ව්‍යවසායකත්ව සංකල්ප සාධනය කිරීම

එල්. එස්. කේ. වික්‍රමසිංහ
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
[illegible] අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

02. තරගය සඳහා ආවරණය වන විෂය පථය:

| ශීර්ෂ අංකය | ශිල්ප ක්ෂේත්‍රය | කේත අංකය |
|---|---|---|
| 01 | මැටි ආශ්‍රිත කලා ශිල්ප නිර්මාණ | |
| | I. රතුමැටි නිර්මාණ | 0101 |
| | II. දිස්න මැටි නිර්මාණ (සෙරමික්) | 0102 |
| .02 | කෙඳි පත්‍ර හා තෘණ ආශ්‍රිත නිර්මාණ | |
| | I. පැදුරු නිර්මාණ | 0201 |
| | II. කෙඳි නිර්මාණ (කොහු කෙඳි හැර) | 0202 |
| | III. පත්‍ර හා තෘණ නිර්මාණ (තල කොළ හා තල් කොළ හැර) | 0203 |
| 03 | දුම්බර රටා කලා ශිල්ප නිර්මාණ | |
| | I. හණ නිර්මාණ | 0301 |
| | II. කපු නිර්මාණ | 0302 |
| 04 | වේවැල් හා උණ බට ආශ්‍රිත කලා ශිල්ප නිර්මාණ | |
| | I. වේවැල් නිර්මාණ | 0401 |
| | II. උණබට නිර්මාණ | 0402 |
| | III. කලාත්මක වේවැල් හා උණබට ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිර්මාණ | 0403 |
| 05 | ලෝහ භාවිත කලා ශිල්ප නිර්මාණ | |
| | I. ලෝහ වාත්තු නිර්මාණ | 0501 |
| | II. ලෝහ කැටයම් නිර්මාණ | 0502 |
| | III. රිදී කැටයම් නිර්මාණ | 0503 |
| | IV. රන් කැටයම් නිර්මාණ | 0504 |
| 06 | ආභරණ කලා ශිල්ප | |
| | ලෝහමය ආභරණ | 0601 |
| | ගල්බැඳි ආභරණ | 0602 |
| | විවිධ ආභරණ | 0603 |
| 07 | වෙස් මුහුණු හා රූකඩ කලා ශිල්ප නිර්මාණ | |
| | I. සාම්ප්‍රදායික වෙස් මුහුණු | 0701 |
| | II. රූකඩ නිර්මාණ | 0702 |
| | III. සාම්ප්‍රදායික නොවන වෙස් මුහුණු | 0703 |
| 08 | කැටයම් මුහුණු කලා නිර්මාණ | |
| | I. කැටයම් මුහුණු කලා නිර්මාණ | 0801 |
| 09 | සංගීත භාණ්ඩ කලා නිර්මාණ | |
| | I. සාම්ප්‍රදායික සංගීත භාණ්ඩ කලා නිර්මාණ (බෙර) | 0901 |
| | II. දේශීය සංගීත භාණ්ඩ | 0902 |
| 10 | රෙදි පිළි හා රෙදි පිළි භාවිත කලා ශිල්ප නිර්මාණ | |
| | I. අත් එම්බ්‍රොයිඩර් නිර්මාණ | 1001 |
| | II. මැෂින් එම්බ්‍රොයිඩර් නිර්මාණ | 1002 |
| | III. රෙදි පින්තාරු නිර්මාණ | 1003 |
| | IV. පැච්වර්ක් නිර්මාණ | 1004 |
| | V. පාරම්පරික අත් යන්ත්‍ර රෙදිපිළි නිර්මාණ | 1005 |
| 11 | බතික් නිර්මාණ | |
| | I. බතික් බිත්ති සැරසිලි නිර්මාණ | 1101 |
| | II. බතික් වෙනත් නිර්මාණ | 1102 |
| 12 | රේන්ද නිර්මාණ | |
| | I. බීරළු රේන්ද නිර්මාණ | 1201 |
| | II. සැටින් රේන්ද නිර්මාණ | 1202 |
| | III. අත් රේන්ද නිර්මාණ | 1203 |

| | | |
|---|---|---|
| 13 | ලාක්ෂා නිර්මාණ<br>I. ලාක්ෂා නිර්මාණ | 1301 |
| 14 | දැව භාවිත කලා ශිල්ප නිර්මාණ<br>I. දැව කැටයම් නිර්මාණ<br>II. දැව මූර්ති නිර්මාණ<br>III. දැව භාවිත වෙනත් නිර්මාණ | 1401<br>1402<br>1403 |
| 15 | සම් භාණ්ඩ ආශ්‍රිත නිර්මාණ<br>I. සම් භාණ්ඩ නිර්මාණ | 1500 |
| 16 | පාෂාණ ආශ්‍රිත කලා ශිල්ප නිර්මාණ<br>I. පාෂාණ මූර්ති නිර්මාණ<br>II. පාෂාණ කැටයම් නිර්මාණ<br>III. පාෂාණ ආශ්‍රිත වෙනත් නිර්මාණ | 1601<br>1602<br>1603 |
| 17 | චිත්‍ර හා මූර්ති කලා ශිල්ප නිර්මාණ (සාම්ප්‍රදායික)<br>I. සාම්ප්‍රදායික චිත්‍ර නිර්මාණ (ඉපැරණි බිතු සිතුවම් ආශ්‍රිත)<br>II. සාම්ප්‍රදායික මූර්ති නිර්මාණ (බලි තොවිල් හා ශාන්ති කර්ම ආශ්‍රිත)<br>III. පාරම්පරික උත්සව ආශ්‍රිත කලා නිර්මාණ | 1701<br>1702<br>1703 |
| 18 | පොල්/ කිතුල්/ තල/ තල් ගස් ආශ්‍රිත නිර්මාණ<br>I පොල් කටු නිර්මාණ<br>II ඉරටු/ මටළු/ කිතුල් නිර්මාණ<br>➢ කොහු කෙඳි නිර්මාණ<br>➢ තල් කොළ නිර්මාණ<br>➢ තල කොළ නිර්මාණ<br>➢ පොල් ගෙඩි නිර්මාණ | 1801<br>1802<br>1803<br>1804<br>1805<br>1806 |
| 19 | විවිධ කලා ශිල්ප නිර්මාණ<br>I. කඩදාසි ආශ්‍රිත නිර්මාණ<br>II. පල්ප් නිර්මාණ<br>III. දැව සුණු ආශ්‍රිත නිර්මාණ<br>IV. සිප්පිකටු ආශ්‍රිත නිර්මාණ<br>V. විවිධ අමුද්‍රව්‍ය භාවිත කලා නිර්මාණ | 1901<br>1902<br>1903<br>1904<br>1905 |
| 20 | සිහිවටන නිර්මාණ<br>I. සිහිවටන නිර්මාණ | 2001 |
| 21 | සේසත් නිර්මාණ<br>I. සේසත් නිර්මාණ | 2101 |

**03.** තරග මට්ටම්

I. ශ්‍රී ලංකාවේ පළාත් 09 ආවරණය වන පරිදි ජාතික හා පළාත් සභා පාසල්වල අධ්‍යයන කටයුතුවල නිරත පාසල් සිසුන්ට මේ සඳහා සහභාගී විය හැකි ය.

II. සියලුම පාසල්වල සිසු සිසුවියන්ට මෙම තරගය සඳහා ඇතුළත් වීමට හැකි අතර ඉහත සඳහන් කරන ලද ක්ෂේත්‍රවලින් ඔවුන්ගේ හස්ත කර්මාන්ත නිර්මාණ, තම පාසලේ විදුහල්පතිගේ නිර්දේශය මත කලාප තරග සඳහා ඉදිරිපත් කෙරේ.

III. අධ්‍යාපන කලාපයේ ඉහත සඳහන් කරන ශිල්ප ක්ෂේත්‍ර අනුව ප්‍රථම, දෙවන, තෙවන වශයෙන් ස්ථානීය ජයග්‍රහණ හිමි කර ගන්නා නිර්මාණ පළාත් තරගය සඳහා ඉදිරිපත් කෙරේ.

IV. පළාත් තරගයෙන් ජයග්‍රහණය කරන නිර්මාණ අතුරින් එක් ශිල්ප ක්ෂේත්‍රයකින් ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන හා කුසලතා නිර්මාණ 03ක් වශයෙන් ජාතික තරගය සඳහා ඉදිරිපත් කෙරේ.

එල්. එස්. කේ. වික්‍රමසිංහ
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල

V කලාප, පළාත් ජයග්‍රහණ ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පමණක් පිරිනමන අතර ජාතික මට්ටමින් ජයග්‍රහණ ලබා ගන්නා සිසුන් සඳහා එක් එක් ක්ෂේත්‍ර සඳහා පහත ආකාරයෙන් මූල්‍ය ත්‍යාග ද පිරිනමනු ලැබේ.

| | | |
|---|---|---|
| ප්‍රථම ස්ථානය | - | රු. 25,000.00 |
| දෙවන ස්ථානය | - | රු. 15,000.00 |
| තෙවන ස්ථානය | - | රු. 10,000.00 |
| කුසලතා | - | රු. 5,000.00 |

සමස්ත ලංකා හොඳම නිර්මාණය ඉදිරිපත් කරන පාසලට සමස්ත ලංකා පාසල් හස්ත කර්මාන්ත සම්මානය සමඟ රු 100,000.00.ක් පිරිනැමේ. මෙම සහතික පත්‍ර සහ ත්‍යාග පිරිනැමීම ජාතික ශිල්ප සභාව විසින් සිදු කරනු ලැබේ.

**04.** කාල රාමුව

| | | |
|---|---|---|
| කලාප මට්ටමේ තරග | - | අදාළ වර්ෂයේ ජනවාරි 31 ට පෙර |
| පළාත් මට්ටමේ තරග | - | අදාළ වර්ෂයේ පෙබරවාරි / මාර්තු |
| ජාතික තරගය | - | අදාළ වර්ෂයේ මැයි 31 ට පෙර |

**05.** සංවිධානය

<u>පළමු වන තරග අදියර</u>

සියලුම පාසල්වල සිසුන් විසින් ඉදිරිපත් කරන නිර්මාණ පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප මට්ටමේ තරගය වෙත ඉදිරිපත් කළ යුතු ය. කලාප අධ්‍යාපන කාර්යාලයේ ශිල්ප කලා විෂයය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ බලය පවරන ලද අධ්‍යාපන නිලධාරියෙක් සහ ජාතික ශිල්ප සභාවේ දිස්ත්‍රික් සංවර්ධන සහකාර විසින් කලාප තරගය සංවිධානය කළ යුතු ය. මෙම තරගයේ දී විෂයය ක්ෂේත්‍රයකින් ප්‍රථම, දෙවන හා තෙවන නිර්මාණ පමණක් තෝරා ගෙන පළාත් තරගය සඳහා ඉදිරිපත් කරනු ඇත.

<u>දෙවන තරග අදියර</u>

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශිල්ප කලා විෂයය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ බලය පවරන ලද අධ්‍යාපන නිලධාරියෙක් සහ ජාතික ශිල්ප සභාවේ සහකාර අධ්‍යක්ෂ (පළාත්) විසින් තරගය සංවිධානය කළ යුතු ය. කලාප මට්ටමේ තරග විනිශ්චයේ දී එක් විෂයය ක්ෂේත්‍රයකින් ප්‍රථම, දෙවන තෙවන හා කුසලතා නිර්මාණ 03ක් පමණක් තෝරාගනු ඇත. එම නිර්මාණ ජාතික තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

<u>තෙවන තරග අදියර</u>

තරගය හා ප්‍රදර්ශනය සංවිධානය කරනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිල්ප කලා විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන ලේකම් විසින් බලය පවරන ලද නිලධාරියෙක් සහ ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ විසිනි. මෙම තරගයේ දී ජාතික මට්ටමින් ප්‍රථම, දෙවන, තෙවන සහ කුසලතා නිර්මාණ 05ක් තෝරාගනු ඇත. එමෙන්ම හොඳම නිර්මාණය ඉදිරිපත් කරන පාසල ද තෝරා ගනු ලැබේ.

**06.** **ඇගැයීම් / ජයග්‍රාහී හස්ත කර්මාන්ත තෝරා ගැනීම.**

පාසල් සිසුන් විසින් නිර්මාණය කරනු ලබන හස්ත කර්මාන්ත නිර්මාණ පහත සඳහන් නිර්ණායක අනුව ඇගැයීමට ලක් කෙරෙනු ඇත.

| විස්තරය | ලකුණු |
|---|---|
| භාවිත අමුද්‍රව්‍ය | 20 |
| වර්ණ හා හැඩතල | 20 |
| නිර්මාණාත්මක භාවය | 20 |
| ගුණාත්මකභාවය | 20 |
| උපයෝගීතාව | 20 |
| **එකතුව** | **100** |

ඉහත නිර්ණායක අනුගමනය කරමින් කලාප මට්ටමින් , පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් නිර්මාණ තෝරාගනු ඇත.

තෝරා ගන්නා ජයග්‍රාහී නිර්මාණ සඳහා විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

07. සංවිධානය හා විනිශ්චය කටයුතු

කලාප තරඟය

කලාප අධ්‍යාපන කාර්යාලයේ ශිල්ප කලා විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ජාතික ශිල්ප සභාවේ දිස්ත්‍රික් සංවර්ධන සහකාර විසින් තරගය සංවිධානය කරනු ඇත.

පළාත් තරඟය

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශිල්ප කලා විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ජාතික ශිල්ප සභාවේ සහකාර අධ්‍යක්ෂ (පළාත්) විසින් පළාත් තරඟය සංවිධානය කරනු ඇත.

විනිශ්චය මණ්ඩලය

කලාප සහ පළාත් තරගය සඳහා විනිශ්චය මණ්ඩලය පත් කරනු ලබන්නේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශිල්ප කලා විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ජාතික ශිල්ප සභාවේ සහකාර අධ්‍යක්ෂ (පළාත්) විසිනි. මෙම විනිශ්චය මණ්ඩලයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් පස් දෙනෙකු සහභාගී වේ.

ජාතික තරඟය

අධ්‍යාපන ලේකම්ගේ නියෝජිතයෙකු සහ ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ විසින් තරගය සංවිධානය කරනු ඇත.

විනිශ්චය මණ්ඩලය

ජාතික තරගයේ ජාතික මට්ටමේ ඇගයීම් සඳහා විනිශ්චය මණ්ඩලයට, අධ්‍යාපන ලේකම් විසින් නම් කරන ලද නියෝජිතයෙකු සහ ජාතික ශිල්ප සභාවේ අධ්‍යක්ෂ විසින් විශේෂඥ දැනුම ඇති 05 දෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කර තරඟය පැවැත්වීම.

08. තීරක මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු හා සහ ජාතික ශිල්ප සභාවේ සභාපති විසින් නම් කරනු ලබන ජාතික ශිල්ප සභාවේ නියෝජිතයින් දෙදෙනෙකු තීරක මණ්ඩලය ලෙස පත් කරනු ඇත.

මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 15/2016 අංක දරණ 2016.04.28 දිනැති චක්‍රලේඛය අවලංගු කරන අතර මෙතැන් සිට ඉදිරියට මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලාත්මක වේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

එල්. එස්. කේ. වික්‍රමසිංහ
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
තාක්ෂණ අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල